# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1244/7 - 2002 ජූලි 09 වැනි අඟහරුවාදා - 2002.07.09

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78 V.

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

27(1) වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, තෘතීය අධ්‍යාපන හා පුහුණු අමාත්‍ය කබීර් හෂීම් වන මම, එකී පනතේ 21 වන වගන්තිය යටතේ කරන ලද නියමයන් බවට එකී පනතේ 139 වන වගන්තිය ප්‍රකාරව සලකනු ලබන පේරාදෙණිය විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන් කරන ලද (මෙහි මින් මතු 'අදාල නියමය' යනුවෙන් සඳහන් කරනු ලබන) නියමය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, එකී විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය සමන්විත වන්නා වූ අධ්‍යාපන අංශ ලෙස අදාල නියමයෙහි නිශ්චිතව දක්වා ඇති අධ්‍යාපන අංශය ඉවත් කොට ඒ වෙනුවට මෙහි උපලේඛනයෙහි දක්වා ඇති අධ්‍යාපන අංශ ආදේශ කිරීමෙන් මේ නියමය මගින් සංශෝධනය කරනු ලැබේ.

උපලේඛනය

1. මූලික පශු විද්‍යා අධ්‍යයන අංශය,
2. ව්‍යාධි ජෛව විද්‍යා අධ්‍යයන අංශය,
3. පශු සායනික විද්‍යා අධ්‍යයන අංශය,
4. ගොවිපල සත්ව නිෂ්පාදනය හා සෞඛ්‍ය අධ්‍යයන අංශය.

කබීර් හෂීම්,
තෘතීය අධ්‍යාපන හා පුහුණු අමාත්‍ය.

2002 ජූලි මස 02 වැනි දින,
කොළඹ දී ය.

07-562


1A-G 001616 - 1,050 (2002/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.